
# දඟකාර අලි පැංචා



දුල්නිත මින්දිය බණ්ඩාර සුභසිංහ

# දඟකාර අලි පැංචා

## දුල්නිත මින්දිය බණ්ඩාර සුභසිංහ


මහ/ධර්මරාජ විද්‍යාලය

**4 ශ්‍රේණිය**



**ISBN 978-624-211-132-2**

# පිදුම

අනේක විද දුක් ගැහැට විදිමින් අකුරු කරන්නට
වරම් දෙන මාගේ අම්මාට සහ අප්පච්චිට මේ
පොත ආදරයෙන් පුදන්නෙමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකි වීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියවී ඇති ළමා ග්‍රන්ථ ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලාවට උපහාරයක් දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මහපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුද කරමු.

ශෂිකලා සේනාධීර<br>
විදුහල්පතිනිය<br>
මහමායා බලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ ආරම්භ කර ඇති හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වුණු ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යය කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත්වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතු වීම ඉතා ප්‍රසංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරි නමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්.අභයකෝන්,

ආණ්ඩුකාරවර මධ්‍යම පළාත ,

සම්මානිත මහාචාර්ය පේරාදෙණිය විශ්ව විද්‍යාලය

2026.05.10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතිය සංවිධානය කළ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල් වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

**ප්‍රදීප් නිලංග දැල,**
**දියවඩන නිලමේ,**
**ශ්‍රී දළදා මාළිගාව**
**2026.05.10**

# දඟකාර අලි පැංචා



එක කැලෑවක අලි පවුලක් ජීවත් වුණා. මේ අලි පවුලේ දඟකාරා අලි පැංචෙක් හිටියා. එක දවසක් අම්මයි තාත්තයි

කෑම සොයන්න යන්න අලි පැංචාට කතා කළා.

"අනේ අම්මේ අද නම් මට එන්න බැහැ.''

"ඇයි පුතේ බෑ කියන්නේ...? එන්න යන්න අපිත් එක්ක කෑම සොයාගෙන එන්න.''

"මට බෑ... මට බෑ... අම්මේ.''
"හා එහෙනම් ඉන්නකෝ.''
අලි පැංචාට හරි සතුටුයි. අලි පැටියා හනි හනිකට දුව ගෙන ගොස් ළඟ තිබුණු විලකට පැන සෙල්ලම් කරන්න පටන් ගත්තා. ටික වෙලාවක් යද්දි එයාට විලේ සෙල්ලම් කරන එක එපා වුණා.



යලිත් අලිපැංචා කැලේ ඇවිදින්න පටන්ගත්තා. ටික දුරක් කැලේ ඇවිද ගෙන යනකොට උඩ පනිමින් දුව ගෙන එන මුව පැටියෙක් දැක්ක අලි පැටියා .

"මටත් මුවෙක් වෙන්න ඇත්නම් " යැයි සිතූ අලි පැටියා උඩ පනිමින් දුවන්න පටන් ගත්තා. උඩ පනිමින් දුව ගෙන යන අලි පැංචා ජබොක්! ගාලා රොන් මඩ පිරුණු වතුර වලකට වැටුණා.

" අනේ..." අපොයි! බැරි දේවල් කරන්න ගිහින් මට වුණු දෙයක්.

"අනේ මාව බේරා ගන්න." කියලා අලි පැංචා කෑ ගහන්න පටන් ගත්තා .

අලි පැංචා බේරා ගන්න කවුරුත් හිටියේ නැහැ. "අම්මේ...අම්මේ...මාව බේරා ගන්න කියලාත් කෑ ගැසුවා."



ඒත් අලි පැංචා බේරා ගන්න කවුරුත් හිටියේ නෑ. ගොඩට එන්න උත්සහ කළත් ගොඩට එන්න බැරි වුණා.

දැන් අලිපැටියාට හොඳටෝම මහන්සියි. ඒ මදිවට බඩගිනියි. කෑම සොයා ගෙන ආ අම්මයි තාත්තයි පැටියට කතා කළා. ඒත් අලි පැටියා ආවේ නෑ. අම්මයි තාත්තයි කලබල වෙලා අලි පැටියා සොයන්න පටන් ගත්තා. ඒත් සොයා ගන්න බැරි වුණා. හොදටෝම කළුවර වුණා. අම්මාටයි තාත්තාටයි හරිම දුකයි.

"අනේ මගේ පුතාට ලොකු කරදරයක් ද දන්නේ නෑ" අම්මා කිවුවා.

"දැන් හොඳටෝම කළුවරයි.අපි හෙට උදෙන් ම පැංචව සොයන්න පටන් ගමු.” තාත්තා කීවා.

කළුවර වැටෙන්න වැටෙන්න බය හිතුණු අලි පැංචා අඬන්න ගත්තා. ඒත් මොනවා කරන්නද බඩගින්නෙම එළි වෙනකම් මඩ වලට වෙලා ඉන්න වුණා.

පසුදා ඉර පායන්නත් කලින් අම්මයි තාත්තයි දෙන්නා අලි පැංචා ගෙන යන්න පිටත් වුණා. කැලේ ඇතුළට ඇතුළට ඇවිද ගෙන යන අලි අම්මාටයි තාත්තාටයි කෙදිරි ගාන හඩක් ඇහුනා . හනි හනිකට අම්මයි තාත්තයි ඒ පැත්තට දුව ගෙන ගියා.



"අනේ අපොයි  මගේ පුතා මඩ වලේ එරිලාණේ." අම්මා අඬන්න ගත්තා.

අලි පැංචා වලෙන් ගොඩ ගන්න උත්සහ කළත් ගොඩට ගන්න බැරි වුණා. ලොකු කොටන් දෙකක් සොයාගෙන ආ අම්මයි තත්තයි වළට දැම්මා ඒත් පැටියාට නම් ගොඩට එන්න බැරි වුණා.

"අනේ මගේ පුතා බේරලා දෙන්න." කියා අම්මා මහා හයියෙන් කෑ ගහන්න පටන් ගත්තා. මේ හඬ ඇසුණු කැලෑ

යාළුවෝ හැමෝම එතනට දුවගෙන ආවා.

යාළුවන්ගේ උදව්වෙන් ගොඩට එන්න උත්සහ කළත් අලිපැටියාට නම් ගොඩට එන්න බැරි වුණා.

අලි පැටියට හොදටෝම බඩගිනියි. වඳුරු යළුවෝ ඉක්මනින් පලතුරු ගොඩක් සොයාගෙන ඇවිත් යාලුවාට දුන්නා. පලතුරු කෑ අලි පැංචා බඩ පුරවා ගත්තා.

බඩගිනි නිවාගත් අලි පැංචා යාළුවන්ගෙ උදව්වෙන් හෙමින් හෙමින් මඩ වලෙන් ගොඩට ආවා. අලි පැටියට දැන් හරිම සතුටුයි.

අම්මා ළගට දුව ගෙන ගිය අලි පැටියා "අම්මේ මට සමාවෙන්න. අම්මා කිව්ව දේ ඇහුවා නම් මට මෙහෙම වෙන්නෙ නැහැනේ" කියලා කීවා.

"ආයේ කවදාවත් නම් මම අම්මා කියන දේවල් අහන්නෙ නැතිව ඉන්නෙ නැහැ. දඟ වැඩ කරන්නෙත් නැහැ"

කියලා අලි පැංචා යාළුවෝ ඉදිරියේ අම්මට පොරොන්දු වුණා.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව් යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව් යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග් රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි.පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම් සාරධර්ම නිපුණතා ප් රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කා ර් ය මණ්ඩලයටද මෙම සද්කාර් ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)